1. Application software consists of programs that execute specific tasks required by the user.
   යෙදුම් මෘදුකාංග යනු පරිශීලකයාට අවශ්‍ය නිශ්චිත කාර්යයන් ඉටු කරන වැඩසටහන්වල එකතුවකි.
2. Preparing documents, preparing budgets and expenditure estimates, watching videos, playing computer games, and searching for information on the internet.
   ලේඛන සකස් කිරීම, අයවැය සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම, වීඩියෝ නැරඹීම, පරිගණක ක්‍රීඩා කිරීම සහ අන්තර්ජාලය ඔස්සේ තොරතුරු සෙවීම.
3. Application software is mainly divided into two types.
   යෙදුම් මෘදුකාංග ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.
4. They are General Purpose Application Software and Special Purpose Application Software.
   ඒවා නම් සාමාන්‍ය කාර්ය සඳහා වන යෙදුම් මෘදුකාංග සහ විශේෂිත කාර්ය සඳහා වන යෙදුම් මෘදුකාංග ය.
5. It is software used for general requirements and day-to-day computer work.
   මේවා සාමාන්‍ය අවශ්‍යතා සහ එදිනෙදා පරිගණක කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංග වේ.
6. Word-processing software, spreadsheet software, and web browsers.
   වචන සැකසුම් මෘදුකාංග, පැතුරුම්පත් මෘදුකාංග සහ වෙබ් බ්‍රව්සර.
7. It is software customized only for specific tasks.
   මේවා නිශ්චිත කාර්යයන් සඳහා පමණක් සකස් කරන ලද මෘදුකාංග වේ.
8. Computer games, school management systems, and banking management systems.
   පරිගණක ක්‍රීඩා, පාසල් කළමනාකරණ පද්ධති සහ බැංකු කළමනාකරණ පද්ධති.
9. An app is a type of application software. For example, Google Maps is an app.
   'ඇප්' එකක් යනු යෙදුම් මෘදුකාංග වර්ගයකි. උදාහරණයක් ලෙස, Google Maps යනු ඇප් එකකි.
10. The basic tools are the keyboard and mouse.
    මූලික මෙවලම් වන්නේ යතුරුපුවරුව සහ මවුස් එකයි.
11. The arrow mark shown on the computer screen that indicates the position of the mouse is called the mouse pointer or cursor.
    පරිගණක තිරය මත මවුස් එකේ පිහිටීම පෙන්නුම් කරන ඊතල ලකුණ 'මවුස් පොයින්ටරය' හෝ 'කර්සරය' ලෙස හැඳින්වේ.
12. A mouse normally has a left button, right button, and scroll wheel.
    සාමාන්‍යයෙන් මවුස් එකක වම් බොත්තම, දකුණු බොත්තම සහ අනුචලන රෝදය යන කොටස් අඩංගු වේ.
13. A normal mouse, wireless mouse, and touch pad.
    සාමාන්‍ය මවුස් එකක්, රැහැන් රහිත මවුස් එකක් සහ ටච් පෑඩ් එකක්.
14. Move the cursor to the required item and click the left mouse button once. The item will be highlighted.
    කර්සරය අවශ්‍ය අයිතමය වෙත ගෙන ගොස් මවුස් එකේ වම් බොත්තම එක් වරක් ක්ලික් කරන්න. එවිට එම අයිතමය ඉස්මතු වී පෙන්වනු ඇත.
15. There are two methods: ක්‍රම දෙකක් ඇත:

- Method I: Double-click the left mouse button on the file or application icon./ i ක්‍රමය: ගොනුව හෝ යෙදුම් අයිකනය මත මවුස් එකේ වම් බොත්තම දෙවරක් ක්ලික් කරන්න.
- Method II: Right-click the icon and select Open from the submenu/ii ක්‍රමය: අයිකනය මත දකුණු බොත්තම ක්ලික් කර, දිස්වන උප මෙනුවෙන් 'Open' තෝරන්න.

#ICT කඩ්ඩාරුව
BSc, Higher Diploma in Information and Communication Technology (SLIIT)
Bachelor of Information and Communication Technology (University of Colombo-UG)

16. Wired keyboards, wireless keyboards, and touch keyboards.
    වයර් සහිත යතුරුපුවරු , රැහැන් රහිත යතුරුපුවරු සහ ස්පර්ශ යතුරුපුවරු.
17. Letter keys are used to type letters of the English alphabet.
    ඉංග්‍රීසි හෝඩියේ අකුරු ටයිප් කිරීම සඳහා අකුරු යතුරු  භාවිතා වේ.
18. The QWERTY layout is the arrangement of letter keys on a keyboard.
    QWERTY සැකැස්ම යනු යතුරුපුවරුවක අකුරු යතුරු පිහිටා ඇති ආකාරයයි.
19. The cursor is the vertical line that appears when you are about to start typing on a document or box. It shows where the typing will begin.
    කර්සරය යනු ලේඛනයක හෝ කොටුවක ටයිප් කිරීම ආරම්භ කිරීමට සූදානම් වන විට දිස්වන සිරස් රේඛාවයි. එය ටයිප් කිරීම ආරම්භ වන ස්ථානය පෙන්වයි.
20. The Caps Lock key is used to type letters in capital or uppercase form. Pressing it again allows lowercase letters to be typed./ Caps Lock යතුර භාවිතා කරනුයේ විශාල අකුරු ටයිප් කිරීමටයි. එය නැවත එබීමෙන් කුඩා අකුරු ටයිප් කිරීමට හැකියාව ලැබේ.
21. The Shift key is used to type capital letters and the upper symbols shown on keys.
    Shift යතුර භාවිතා කරනුයේ විශාල අකුරු සහ යතුරු මත ඉහළින් දැක්වෙන සංකේත ටයිප් කිරීමටයි.
22. The Space Bar is used to insert spaces between words.
    වචන අතර හිස්තැන් ඇති කිරීම සඳහා ස්පේස් බාර් යතුර භාවිතා වේ.
23. The Tab key is used to insert a large space between words or text.
    වචන හෝ පෙළ අතර විශාල හිඩැසක් ඇති කිරීම සඳහා Tab යතුර භාවිතා වේ.
24. The Enter key is used to move the cursor to the next line.
    කර්සරය ඊළඟ පේළියට ගෙන යාම සඳහා Enter යතුර භාවිතා වේ.
25. Arrow keys are used to move the cursor up, down, right, and left.
    කර්සරය ඉහළට, පහළට, දකුණට සහ වමට ගෙන යාම සඳහා ඊතල යතුරු  භාවිතා වේ.
26. The Backspace key deletes one letter, space, or number to the left of the cursor./ Backspace යතුර මගින් කර්සරයට වම්පස ඇති එක් අකුරක්, හිස්තැනක් හෝ අංකයක් මකා දමනු ලැබේ.
27. Incorrect use of the keyboard can cause discomfort and pain in the fingers and wrists.
    යතුරුපුවරුව වැරදි ලෙස භාවිතා කිරීම නිසා ඇඟිලි සහ මැණික් කටුවල අපහසුතා සහ වේදනාව ඇති විය හැක.
28. Graphic software is software used to create graphics and draw pictures or art.
    ග්‍රැෆික් මෘදුකාංග යනු ග්‍රැෆික් නිර්මාණය කිරීමට සහ පින්තූර හෝ කලා නිර්මාණ ඇඳීමට භාවිතා කරන මෘදුකාංගයි.
29. Word processing software is used to create and store documents needed in everyday life. Examples include Microsoft Office and OpenOffice.
    වචන සැකසුම් මෘදුකාංග එදිනෙදා ජීවිතයේදී අවශ්‍ය ලේඛන නිර්මාණය කිරීමට සහ ගබඩා කිරීමට භාවිතා කරයි. Microsoft Office සහ OpenOffice ඊට උදාහරණ වේ.
30. Audio and video editing software is used to create and edit audio and video recordings. Examples include Audacity, Adobe Audition, OpenShot, and Adobe Premiere Pro.
    ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පටිගත කිරීම් නිර්මාණය කිරීමට සහ සංස්කරණය කිරීමට ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග භාවිතා කරයි. Audacity, Adobe Audition, OpenShot සහ Adobe Premiere Pro ඊට උදාහරණ වේ.





BSc, Higher Diploma in Information and Communication Technology (SLIIT)
Bachelor of Information and Communication Technology (University of Colombo-UG)